

## නව අවුරුදු සිරිය හා පැතුම

**තනූජා වෙන්ඩකෝන්** (රොක්ස්බර්ග් පාර්ක්)

අවුරුදු සිරිය රට හැම තැන පැතිරෙන්නේ
ලහි ලහියේම ගේ දොර පිරිසිදු වන්නේ
බත බුලතින් අටු කොටු හෙම පිර වෙන්නේ
අවුරුදු නැකත් වලටයි හැම සැරසෙන්නේ

කැවුම් කොකිස් මුං අළුවා අතිරසලු
කිරිබත් වලින් නිවසේ කිරි ඉතිරෙයිලු
සැම සිත් සතන් සතුටින් පිරි ඉතිරේලු
නව අවුරුදු උදාවී රට හැඩ වෙයිලු

සෑම ගෙදරකම කිරි ඉතිරෙයි එකම වෙලේ
සෑම ගෙදරකම අහර පිසයි එකම වෙලේ
සෑම ගෙදරකම වැඩ අල්ලයි එකම වෙලේ
වෙන කිසි රටක නොමවෙයි මේ ලෙසට බොලේ

ඇඳුමද පැළඳුමද සැමගේ අලුත් වෙලා
නිවසේ සිරියාව යයි ඉතිරී පැතිරිලා
සැම දෙන එකට වට වී මේසයට වෙලා
ආහර ගනියි වැඩිහිටියන් වැඳ පුදලා

ගනුදෙනු කරයි වැඩිහිටි පොඩිහිටි සැවොම
අතමිට සරුයි ලැබෙනා පඬුරෙන් එදින
බුලත් හුරුළු දී වැඳ වැඩි හිටියන්ට
දෙයි ආශිර්වාද හිස අතගා තුටින

මේ අවුරුදු මහේ සැමටම සෙත් වේවා
ලෙඩ දුක් රෝග ඊිය දුරු වී සෙත් වේවා
සිතුවිලි ඔබේ සැම වෙත කරුණා වේවා
තෙරුවන් ගුනෙන් මගෙ ලක් බිම වැජඹේවා




## අනාදරය

**ප්‍රේමවංශ දසනායක**

මිලක් නොමැති නිමක් නොමැති
ආදරයේ සුළං රැල්ල
ඔබත් මාත් දෝතින් ගෙන
අහස් කුසට නැඟුන දිනය

ඔබ නෙත් මිණි පහන් දිලී
මුව හසරැළි මල් ඉහිරී
අප හදවත් එකට වෙලී
උණුසුම් විය උඩු ගුවනේ

ගිරි හෙල් කඳු මුදුන් මතින්
පාවී යන වලා ලෙසින්
ලොව ජය ගෙන සැරිසැරුවෙමු
සිත ගත පිරි සැහැල්ලුවෙන්

සැක සංකාවක් නොදැනින
අවිනිශ්චිත බවක් නොවින
තනි නොතනිය කියා දෙයක්
කිසිවිට හද තුළ නොහැඟින

ඒ දින සති පිය මං වී
පිය බස් දෙඩු මුව ගොලුවී
නිහඬතාව පවුරු වළලු
ඔබ මා අතරේ ඉදිවී

කෙමෙන් කෙමෙන් ඔබ මවෙතින්
දුරස්ව යන සේයාවේ
නෙත බොඳ වී හද උණු වී
දිග සුසුමක් ලය මතු විය

මා නොදැනම මගේ දෑස
ඔබ මුව වෙත යොමුවුන කල
ජීවිතයේ පළමු වරට
දුටුවෙමි මම අනාදරය

ඔබ මා වෙත හෙලූ බැල්ම
සපුරා තිබුනෙය පිළිකුළ
වසුරු පිඩක් පමණකි මා
පෙරදින ඔබ ඇඟ තැවරුන

## ලෙඩ්ඩු බලන වෙලාව

**හෂාන් අබේගුණරත්න**

මං අකමැතිම වෙලාව
ලෙඩ්ඩු බලන වෙලාව

අත් වලින් හොදටම බත් කන්න පුළුවං කොට
ඇඟිලි නැමෙන්නෙ නැති වෙලාව
තනියෙන් දොට්ට පිලට යන්න පුළුවං කොට
අතක් අල්ලගන්නම ඕනෙ වෙලාව

කවුරුවත්ම එන්නෙ නෑ කියලා දැනෙන කොට
කවුරු හරිම එයි කියලා හිතෙන වෙලාව
කාටවත්ම අඬගහන්න හේතු නැති කොට
කාට හරිම අඬගහන්න හිතෙන වෙලාව

ඇස් දෙක නිදියන්නම ඉල්ලන කොට
නින්ද නොයනම වෙලාව
මහා සෙනගක් මැද ඉන්න කොට
තනියෙන් වගේ දැනෙන වෙලාව

මං අකමැතිම වෙලාව
ලෙඩ්ඩු බලන වෙලාව



## සරුන්ගලයයි මම.......

නුඹෙ සොඳුරු සිත් අහස යට
රිසි සේ සරන ඉගිලෙන
උඩුකුරුව යටිකුරුව පිහිනන
වරසැල් සලා හිනැහෙන
සරුන්ගලයයි මම.....

තෙතබරව බිම වැතිරෙන
වැරසැල් කැඩී දසත පාවෙන
මඩ පිරුණු පොලොවට ඇලලුණ
කොර ගගා යළි ඉගිලෙන්නටම තතනන
සරුන්ගලයයි මම.......
ඇගේ පෙම් වැස්සට අහුවුන......

**රාජිකා හර්ශනී**

## පැරණි කවි රස

**රන්කිරි ගුණතිලක**

### ගජමන් නෝනා ජෝන් ඩොයිල් දිසාපතිට ලියූ කවිපෙළ

ගජමන් නෝනා විසින් ස්වකීය අසරණකම ගැන පිහිට ඉල්ලා ජෝන් ඩොයිල් දිසාපති තුමා වෙත ලියා ඔප්පු කරන ලද ප්‍රබන්ධයයි. (සම්පූර්ණ කව)

(මපියාණන් ගේ පොත්ගුලෙහි වූ 1900 වර්ෂයෙහි පලවූ " ඥානාදර්ශය" (VOL-IV) සඟරාවෙන් උපුටා ගන්නා ලදී.)



සතර අනුදෙස තෙදන කිත්යස පසිඳු සරිවන සුරනිඳුන්
විතර නොමවන මෙදිය තුල සත කුමුදු නද කුළ සොම්සඳුන්
සතර දැඩිබල අහිත් රුපුකැන් මහත් ඔදහළ කෙසරිඳුන්
නිතර නමඳිම් දිසා තුම ජෝන් ඩොයිලි සුගපා කර මුදුන්

මෙලක තුල විසි පසෙක සතනට කුළුණු ගුණයෙන් මවකදෝ
නොයෙක දිළිඳුන් නඳන කරවන සුරත දිලි සුරදුමකදෝ
සැණෙක නෙදනන් සිතැඟි සිදුකර දෙවන සිරි සිතුමිනෙකදෝ
නිසැක මතු බුදු බවට පැමිණෙන මහරු පින් බෝසතෙකුදෝ

පසන් සොම්ගුණ රැසින් පුරවර එලිය කරවන සසඳරාමය
කිවින් මනදොල තිළින් පුරවන දිලෙන යුවලත සුරතුරාමය
බඳුන් පදරුත් මෙනෙහි සපුරන සෙයින් නුවණින් ගණිසුරාමය
සිරින් අග ජෝන් ඩොයිලි මෙදිසා උතුම් රූසිරු පුන්සරාමය

නිබඳ පුළුලුර වසන සිරිකත දිගඹුකර යසහර පැළන්දූ
නොමඳ මහමෙත් කුළුණු මිනිරැස මෙපුරවර දෙව් විමන රැන්දූ
අමද රස බස් මුව පියුම් ගැබ සපිරි මෙදිසාපති සමින්දු
දෙපය වැඳගෙන පිහිට ඉල්ලා සිටිමි සහ මාගේ බිලින්දු

නොහිමි සිරිපිරි එන්ගලන්තය දේශයෙන් සැපසේ උදුල්
දිලුම් තෙදකිත් ජොන් ඩොයිල් නම් දිසා සමිඳුනි ගුණ නිමල්
කසුම් මිනිමුතු බෝග ගමබිම් කිසිත් නැත මට මේ සියල්
උතුම් දෙවියන් නමට පිහිටා වෙන්ඩ නමදිම් පාකමල්

සෝම නෙක ගුණෙන් පිරි පුන් සඳක්මය
පේම වන රුවින් පෙර පන් සැරෙක්මය
දීම ගැන නොහිමි තිළි සුර දුමෙක්මය
සෑම යස සිරින් යුතු මහතුමෙක්මය

සඳ තුළ රඳන තියු නැණයෙන් ගනිසුරුය
සඳ ලෙස පැවතී දසරද දම් පියකරුය
සඳ තොස කරන බස සවනට අමයුරුය
සඳ මෙන සොබන යසසිරි නිරතුරු දැරුය

මෙලෙසින් ගුණ නැණින් යස සැපතින් දිලෙන
සියපින් සිරි බෙලෙන් දියතුළ පසිඳු වන
සුපසන් ජෝන් ඩොයිල් මෙදිසාපති සොබන
සමිඳුන් හට නැමද පානෙම් දුක් මෙවන

සිත්ලෙසින් දයා බැඳ වැඩු පිය සුතන
බත් දියන් කියා ඉඳ හඬති තැන තැන
පත් මෙදැන් නොසා මේ තතු ඇති ලෙසින
අත් මුදුන් තියා සිට කියමි වැඳගෙන

සඳ මෙන කවා ඇතිකළ ළම පැටවුන්ඩ
අද දින පමණ නැත බත උන් රැකගන්ඩ
සොඳ ගුණ ජෝන් ඩොයිල් මෙදිසා මැතිඳුන්ඩ
වැඳ ගණ දුක කියමි පිහිටක් ලැබගන්ඩ

ගුණ යුත් සාමිදරුවනි මගෙ සිතු විලස
ලැබුනොත් කිසි පිහිට මෙඔබට පින් පිණිස
යහපත් එගුණ සඳරැස සුරපුර පිවිස
දෙවියොත් තුටුව රඟබැස කරති තුති ගොස

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com